# දැන්වීමයි

## විභාග කටයුතු පිළිබඳ නීතිරීති, විභාග අක්‍රමිකතා හා දඬුවම්

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ 2023/2024 අධ්‍යයන වර්ෂයේ පළමු අර්ධවාර්ෂික පරීක්ෂණය 2025.05.19 වන දින සිට ආරම්භ වී ඇත. විභාග කටයුතු පිළිබඳ නීතිරීති, විභාග අක්‍රමිකතා හා දඬුවම් ඔබගේ දැනගැනීම සඳහා මේ සමඟ අමුණා ඇත. විභාග අක්‍රමිකතා සිදු කිරීමේදී,

- විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.
- අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.
- උපාධි ප්‍රදානෝත්සවයට / සමර්පණෝත්සවයට නොකැඳවීම.
- අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.
- පන්ති / සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.
- ශිෂ්‍යභාවය වසරකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය වසර දෙකකින් හෝ තුනකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය වසර හතරකින් හෝ පහකින් අත්හිටුවීම.
- ශිෂ්‍යභාවය අහෝසි කිරීම.
- ශිෂ්‍යයකු නොවන අවස්ථාවක දී ඔහුට/ඇයට එරෙහිව රටේ පවතින නීතියට අනුව ක්‍රියා කිරීම.
- විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.

වැනි දඬුවම් ද ලැබිය හැකි බව ඔබගේ දැනගැනීම සඳහා වැඩිදුරටත් දන්වමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
2025.05.19

## 4.4 විභාග කටයුතු පිළිබඳ නීතිරීති, විභාග අක්‍රමිකතා හා දඬුවම්

1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 135(1)(උ) දරන වගන්තිය යටතේ සකස් කරන ලදුව, 1986.11.27 දින පැවති විශේෂ පාලක සභා රැස්වීමේ දී අනුමත කොට 1986.12.01 දින සිට ක්‍රියාත්මක කෙරෙන (2008.05.29) දින පැවති 252 සනාතන සභා රැස්වීමේ දී හා 2008.09.11 දින පැවති 352 පාලක සභා රැස්වීමේ දී සහ 2012.02.05 දින පැවති 292 සනාතන සභා රැස්වීමේ දී හා 2012.05.10 දින පැවති 401 පාලක සභා රැස්වීමේදී සංශෝධනය කොට අනුමත කරන ලද 1986 අංක 2 දරන අතුරු ව්‍යවස්ථාව සියලු ම විභාග අපේක්ෂකයන්ගේ දැන ගැනීම හා සටහන් කර ගැනීම සඳහා පහත දක්වා ඇත.

**ප්‍රථම උපාධි, පශ්චාද් උපාධි, බාහිර උපාධි සහ විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන සියලු විභාග වලට පෙනී සිටින අපේක්ෂකයන් සඳහා විභාග පැවැත්වීමේ පටිපාටිය, විභාග අක්‍රමිකතා සහ දඬුවම් පිළිබඳ නීතිරීති**

වාර්ෂික / වර්ෂාර්ධ / වාර පරීක්ෂණ මෙන්ම මධ්‍ය වාර්ෂික / මධ්‍ය වර්ෂාර්ධ / මධ්‍ය වාර පරීක්ෂණ, අඛණ්ඩ ඇගයීම්, ප්‍රායෝගික පරීක්ෂණ සහ පර්යේෂණ නිබන්ධන ආදී සංරචක ගණනාවකින් මෙම විභාග සමන්විත විය හැකිය.

## 1. විභාග පැවැත්වීමේ පටිපාටිය

1.1 විභාග අපේක්ෂකයන් නියමිත ප්‍රශ්න පත්‍රය ඇරඹීමට විනාඩි 15 කට කලින් විභාග ශාලාව වෙත පැමිණිය යුතු අතර, විභාග ශාලාව තුළට පැමිණිය යුත්තේ විභාග ශාලාධිපති විසින් දැනුම් දුන් පසුවය.

1.2 විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළට පිවිසි වහාම තමාගේ අංකයට හිමි අසුනේ අසුන් ගත යුතුය.

1.3 විභාග අපේක්ෂකයන් තමන්ගේ ප්‍රයෝජනය සඳහා පෑන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ වැනි විෂයට අදාළ නීත්‍යානුකූල ව අවසර ලබා දී ඇති අවශ්‍ය උපකරණ පමණක් රැගෙන ආ යුතුය. මීට අමතර ව විභාගයේ දී අනිසි අන්දමින් ප්‍රයෝජනයට ගත හැකි කිසිම ලිඛිත හෝ මුද්‍රිත සටහනක් හෝ උපකරණයක් තමා විසින් ම හෝ තමා වෙනුවෙන් අන් අයකු විසින් හෝ විභාග ශාලාව තුළට නොගෙනෙන බවට වග බලා ගත යුතුය. එවැන්නක් තමා සන්තකයෙහි තබා නොගත යුතු අතර කිසිදු අයුරකින් තම ප්‍රයෝජනයට ගැනීමට ද වෑයම් නොකළ යුතුය. විභාග විෂමාචාරයක යෙදෙන බවට හෝ යෙදී ඇති බවට සැකයක් මතු විය හැකි සෑම ක්‍රියාවකින් ම වැළකීමට සෑම විභාග අපේක්ෂකයකු ම වග බලා ගත යුතුය.

1.4 කිසිදු විභාග අපේක්ෂකයකුට ජංගම දුරකථන, දත්ත ගබඩා කර ඇති හෝ තොරතුරු ලබා ගත හැකි උපකරණ යනාදි කිසිවක් විභාග ශාලාව තුළට ගෙන ඒම හෝ විභාග ශාලාව තුළදී භාවිතා කිරීම සපුරා තහනම් ය.

1.5 විභාගය ආරම්භ වී විනාඩි 30 කට පසුව කිසිම විභාග අපේක්ෂකයෙක් විභාග ශාලාව තුළට ඇතුළු කර ගනු නොලැබේ. එසේම විභාගය අවසන් වන තුරු කිසි ම විභාග අපේක්ෂකයෙකුට ශාලාවෙන් පිටවීමට ද අවසර දෙනු නොලැබේ. අවසරයකින් තොරව විභාග ශාලාවට ඇතුළු වීමට හෝ ඉන් පිටවීමට තැත් නොකළ යුතුය.

1.6 සියලු ම විභාග අපේක්ෂකයන් ස්වකීය විභාග ප්‍රවේශ පත්‍රය, ශිෂ්‍ය වාර්තා පුස්තකය සහ විශ්වවිද්‍යාලයීය අනන්‍යතා පත්‍රය විභාග ශාලාවට රැගෙන පැමිණිය යුතුය. ශිෂ්‍ය වාර්තා පුස්තකයෙහි හා විශ්වවිද්‍යාලයීය අනන්‍යතා පත්‍රයෙහි විභාග අපේක්ෂකයාගේ ඡායාරූපය හා අත්සන තිබිය යුතු අතර, විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී හෝ ඔහුගේ බලයලත් නිලධාරියකු විසින් එය සහතික කොට තිබිය යුතුය. ශිෂ්‍ය වාර්තා පුස්තකයෙහි හෝ අනන්‍යතා පත්‍රයෙහි සඳහන් නම හා විභාග ප්‍රවේශ පත්‍රයේ සඳහන් නම අතර කිසියම් වෙනසක් ඇත්නම්, ඒ බවට ලේඛකාධිකාරී විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. එබඳු සහතිකයක් ඉදිරිපත් නොකරන අවස්ථාවක දී අපේක්ෂකයාගේ ජාතික හැඳුනුම්පත සමග අභ්‍යන්තර විභාග අපේක්ෂකයකු නම් විෂය භාර ආචාර්යවරයකු විසින් ද, බාහිර විභාග අපේක්ෂකයකු නම් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ බාහිර විභාග විසින් ද ශිෂ්‍යභාවය තහවුරු කරමින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

1.7 විභාග ශාලාධිපති හෝ නිරීක්ෂකවරුන් විසින් ඉල්ලා සිටි අවස්ථාවක දී විභාග අපේක්ෂකයන් තමා භාරයේ හෝ තමා ළඟ ඇති ඕනෑම ලිපි ලේඛනයක් හෝ ද්‍රව්‍යයක් ඉදිරිපත් කළ යුතුය.

1.8 කිසිම විභාග අපේක්ෂකයකු තවත් විභාග අපේක්ෂකයකුගෙන් කිසියම් දෙයක් ඉල්ලා ගැනීම හෝ හුවමාරු කර ගැනීම හෝ කතාබස් කිරීම හෝ කොපි කිරීම හෝ කුමන අන්දමක හෝ ආධාරයක් ලබා ගැනීම හෝ උපකාර කිරීම හෝ නොකළ යුතුය. යම් අවශ්‍යතාවයක් ඇත්නම් තම අත එසවීමෙන් පමණක් ඒ බව ශාලාධිපති / නිරීක්ෂක වෙත දන්විය යුතුය.

1.9 නියමිත ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා ශාලාධිපති හෝ නිරීක්ෂක අත්සන යොදා එදිනට නිකුත් කරන ලද පිළිතුරු ලියන පොත් හා කඩදාසි පමණක් යොදා ගත යුතුය.

1.10 පිළිතුරු ලිවීම සඳහා අවශ්‍ය කෙරෙන දින මුද්‍රාව යෙදූ ලියන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි හා ඇඳීමේ කඩදාසි වැනි ලිපි ද්‍රව්‍ය අවශ්‍ය පරිදි විභාග අපේක්ෂකයන් වෙත නිකුත් කරනු ලැබේ. තමාට දෙන ලද කිසිම කඩදාසියක් හෝ ලියන පොතක් ඉරීම, සූරා දැමීම, නැවීම, පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ නොකළ යුතුය. ශාලාධිපති / නිරීක්ෂක විසින් දෙන ලද ලිපිද්‍රව්‍ය පමණක් පාවිච්චි කළයුතු අතර,ගණිත වගු යනාදිය නිසි පරිදි භාවිත කිරීමෙන් පසුව තම මේසය මත ම තැබිය යුතුය. තමා වෙත සපයන ලද භාවිත කළ හෝ නොකළ සියලු ම ලිපි ද්‍රව්‍ය හා උපකරණ ස්වකීය මේසය මත ම තබා යා යුතු අතර කිනම් හේතුවක් මත හෝ ඒවා විභාග ශාලාවෙන් පිටත ගෙනයාම නොකළ යුතුය.

1.11 පිළිතුරු ලිවීමට පෙර, තමාට අයත් සංකේත සහිත විභාග අංකය හා විභාගයේ නම පැහැදිලි ලෙස පිළිතුරු පත්‍රයෙහි නියම තැන ලිවිය යුතුය. පිළිතුරු ලිවීමට යොදා ගන්නා අනෙකුත් සියලු ම කඩදාසිවල ද ස්වකීය විභාග අංකය යොදා තිබිය යුතුය. කිසිම විභාග අපේක්ෂකයකු ස්වකීය නම හෝ වෙනත් හඳුනා ගැනීමේ සලකුණු යනාදිය පිළිතුරු පත්‍රයෙහි සඳහන් නොකළ යුතුය.

1.12 කටුවැඩ ආදිය සඳහා යොදා ගන්නා ලද ලියන කඩදාසි ද පිළිතුරු පත සමග අමුණා තිබිය යුතුය. පිළිතුරු පත්‍රයට අනවශ්‍ය කොටස් පැහැදිලිව ඉරි ගසා කපා දැමිය යුතුය. ප්‍රවේශ පත්‍රය, කාල සටහන හෝ ප්‍රශ්න පත්‍රය යනාදියෙහි කටුවැඩ නොකළ යුතුය.

1.13 සියලු ම විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ ශාලාධිපතිට, නිරීක්ෂකවරුන්ට, ශාලා සේවකයන්ට සහ අනෙකුත් අපේක්ෂකයන්ට බාධා හෝ හිරිහැර නොවන සේ හැසිරිය යුතුය. විභාග ශාලාව තුළ හා අවට නිශ්ශබ්ද ව සිටිය යුතුය.

1.14 කිසිම විභාග අපේක්ෂකයකු තමා විසින් ම ලියන ලද වාර පත්‍රිකාවක්, පැවරුමක්, පර්යේෂණ පත්‍රිකාවක්, ප්‍රායෝගික හෝ ක්ෂේත්‍ර පොතක් හෝ නිබන්ධනයක් මිස, මුළුමනින් ම හෝ කොටසක් වශයෙන් හෝ අන් තැනැත්තකු විසින් සකස් කරන ලද්දක් උද්ධෘතයකින් තොරව ඉදිරිපත් කිරීම වැනි බුද්ධිමය දේපළ වංචා (රචනා චෞරය) සිදු කිරීම නොකළ යුතුය.

1.15 කිසිම අපේක්ෂකයකු තමා වෙනුවෙන් වෙනත් කෙනෙකුට විභාගයට ඉදිරිපත් වීමට ඉඩ නොදිය යුතු අතර, වෙනත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටීමට ද කිසිවෙකුටත් අවසර නැත.

1.16 විභාග ශාලාවේ දී උද්ගත වන ඕනෑම කරුණක් වෙනුවෙන් විභාග අපේක්ෂකයකුගෙන් ලිඛිත ප්‍රකාශයක් ඉල්ලීමට සහ ලබා ගැනීමට ශාලාධිපතිට හා නිරීක්ෂකවරුන්ට බලය තිබේ.

1.17 ස්වකීය පිළිතුරු පත්‍රය ශාලාධිපතිට හෝ නිරීක්ෂකවරයකුට සියතින් ම භාරදිය යුතුය. එමෙන්ම පිළිතුරු පත්‍ර එකතු කිරීමේ කාර්යය අවසන් කොට ශාලාධිපති නිවේදනය කරන තුරු සිය අසුනේ අසුන් ගෙන සිටිය යුතුය. කවර කරුණක් මත හෝ ඔබගේ පිළිතුරුපත්‍රය විභාග ශාලාවෙහි සේවකයකුට හෝ වෙනත් කෙනෙකුට භාර නොදිය යුතුය. ශාලාධිපතිවරයාට හෝ නිරීක්ෂකයකුට භාර දෙන ලද පිළිතුරු පත්‍රයක් කිසිම හේතුවක් මත විභාග අපේකෂකයකුට නැවත භාරදෙනු නොලැබේ. විභාග අපේක්ෂකයන් විසින් එසේ ඉල්ලා සිටීම ද නොකළ යුතුය.

1.18 යම් හෙයකින් පිළිතුරු පත්‍ර පරීක්ෂා කරන අතර තුරේදී කිසියම් අක්‍රමිකතාවයක් කර ඇති බවට පිළිතුරු පත්‍ර ලකුණු කරන පරීක්ෂකවරයා සොයා ගත හොත් එය ද දඬුවම් ලැබිය හැකි වරදක් බව විභාග අපේක්ෂකයා දත යුතුය.

## 2. විභාග අක්‍රමිකතා

2.1 අනවසර ලිපි ලේඛන තමා සන්තකයෙහි තබා ගැනීම.

2.2 අවසරයකින් තොරව ජංගම දුරකථන ඇතුළු දත්ත ගබඩා කර ඇති හෝ තොරතුරු ලබා ගත හැකි උපකරණ තමා සන්තකයෙහි තබා ගැනීම.

2.3 විභාග ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම.

2.4 කිනම් අයුරකින් හෝ කොපි කිරීම හෝ ඒ සඳහා තැත් කිරීම.

2.5 විශ්වවිද්‍යාලයට අයත්, අතීතයේ දී පිටතට ගෙන යන ලද විභාග ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවේ දී භාවිත කිරීම හෝ තමා සන්තකයෙහි තබා ගැනීම.

2.6 ශරීරයේ හෝ ඇඳුම් පැළඳුම් ආදියෙහි හෝ කරුණු සටහන් කර ගෙන පැමිණීම.

2.7 උද්ධෘතයකින් තොරව අන් අයකුගේ ක්ෂේත්‍ර වාර්තා පොතකින්, පර්යේෂණ පත්‍රිකාවකින් නිබන්ධනයකින්, වෙනත් පොතකින් හෝ අන්තර්ජාලයෙන් කරුණු ඉදිරිපත් කිරීම වැනි බුද්ධිමය දේපළ වංචාවන් (රචනා චෞරය) සිදු කිරීම.

2.8 ප්‍රශ්න පත්‍රයක හෝ පිළිතුරු පත්‍රයක ඇතුළත් දේ අයථා ලෙස දැන ගැනීම හෝ ඒ සඳහා තැත් කිරීම.

2.9 අවසරයකින් තොරව විභාග ශාලාවට ඇතුළු වීම.

2.10 අවසරයකින් තොරව විභාග ශාලාවෙන් පිටවීම හෝ ඒ සඳහා තැත් කිරීම හෝ අනුබල දීම.

2.11 කිසිදු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරීම, පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ ඒ සඳහා තැත් කිරීම හෝ ඊට අනුබල දීම.

2.12 විභාග ශාලාවේ නිශ්ශබ්දතාවයට හා නිසි පරිදි කටයුතු කරගෙන යාමට බාධාවන පරිදි කටයුතු කිරීම.

2.13 විභාග ශාලාධිපතිගේ හෝ / සහ නිරීක්ෂකවරුන්ගේ හෝ / සහ ශාලා සේවකයන්ගේ ආත්ම ගරුත්වයට හානි වන ලෙස සහ මානසික ආතතියක් ඇති වන පරිදි අනිසි අන්දමින් හැසිරීම.

2.14 විභාග ශාලාධිපති, නිරීක්ෂකවරුන්, ශාලා සේවකයන් සහ අනෙකුත් විභාග අපේක්ෂකයන්ට මානසික හෝ ශාරීරික හිංසා කිරීමට සැලසුම් කිරීම, තැත් කිරීම හෝ හිංසා කිරීම.

2.15 අපේක්ෂකයකු තමන් වෙනුවෙන් පෙනී සිටීමට වෙනත් අයෙකු යෙදවීම හෝ වෙනත් අපේක්ෂකයකුගේ විභාග අංකයක් භාවිත කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම.

2.16 වෙනත් විභාග අපේක්ෂකයකු වෙනුවෙන් පෙනී සිටීම.

2.17 සනාතන සභාව මගින් තීරණය කළ හැකි අනෙකුත් විභාග අක්‍රමිකතා.

2.18 පිළිතුරු පත්‍ර ලකුණු කරන පරීක්ෂකවරයකු විසින් සොයා ගනු ලබන අක්‍රමිකතා.

2.19 විභාග අක්‍රමිකතාවක් කිරීමට ආධාර හෝ අනුබල දීම.

## 3. දඬුවම්

3.1 විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.

3.2 අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.

3.3 උපාධි ප්‍රදානෝත්සවයට / සමර්පණෝත්සවයට නොකැඳවීම.

3.4 අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.

3.5 පන්ති / සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.

3.6 ශිෂ්‍යභාවය වසරකින් අත්හිටුවීම.

3.7 ශිෂ්‍යභාවය වසර දෙකකින් හෝ තුනකින් අත්හිටුවීම.

3.8 ශිෂ්‍යභාවය වසර හතරකින් හෝ පහකින් අත්හිටුවීම.

3.9 ශිෂ්‍යභාවය අහෝසි කිරීම.

3.10 ශිෂ්‍යයකු නොවන අවස්ථාවක දී ඔහුට/ඇයට එරෙහිව රටේ පවතින නීතියට අනුව ක්‍රියා කිරීම.

3.11 විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.

අක්‍රමිකතාවෙහි ස්වරූපය අනුව ඒ ඒ අක්‍රමිකතාවය සඳහා ලබා දිය යුතු දඬුවම් පහත දැක්වෙන පරිදි ලේඛන ගත කර ඇත.

| විභාග අක්‍රමිකතාවය | දඬුවම් |
|---|---|
| 2.1 අනවසර ලිපි ලේඛන තමා සන්තකයෙහි තබා ගැනීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br><br>(3.2, 3.3 සහ 3.4) |
| 2.2 අවසරයකින් තොරව ජංගම දුරකථන ඇතුළු දත්ත ගබඩා කර ඇති හෝ තොරතුරු ලබා ගත හැකි උපකරණ තමා සන්තකයෙහි තබා ගැනීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>(3.2, 3.3 සහ 3.4) |
| 2.3 විභාග ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම. | • විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේ දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමාකිරීම.<br>(3.1) |
| 2.4 කිනම් අයුරකින් හෝ කොපි කිරීම හෝ ඒ සඳහා තැත් කිරීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br><br>(3.2, 3.3 සහ 3.4) |

| | |
|---|---|
| 2.5 විශ්වවිද්‍යාලයට අයත්, අතීතයේදී පිටතට ගෙන යන ලද විභාග ලිපි ද්‍රව්‍ය විභාග ශාලාවේ දී භාවිත කිරීම හෝ තමා සන්තකයෙහි තබාගැනීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br><br>(3.2, 3.3 සහ 3.4) |
| 2.6 ශරීරයේ හෝ ඇඳුම් පැළඳුම් ආදියෙහි හෝ කරුණු සටහන් කර ගෙන පැමිණීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>(3.2, 3.3 සහ 3.4) |
| 2.7 (i) උද්ධෘතයකින් තොරව අන් අයකුගේ ක්‍ෂේත්‍ර වාර්තා පොතකින්, පර්යේෂණ පත්‍රිකාවකින් නිබන්ධනයකින්, වෙනත් පොතකින් හෝ අන්තර්ජාලයෙන් කරුණු ඉදිරිපත් කිරීම වැනි බුද්ධිමය දේපළ වංචාවන්(රචනා චෞරය) සිදුකිරීම. | • පන්ති /සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.<br>• ශිෂ්‍යභාවය වසරකින් අත්හිටුවීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට(ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br><br>(3.5, 3.6, සහ 3.11) |
| 2.7(ii) තම වාර පත්‍රිකාව, පැවරුම, පර්යේෂණ පත්‍රිකාව, ප්‍රායෝගික හෝ ක්ෂේත්‍ර පොත හෝ උපාධි නිබන්ධය සහමුලින්ම හෝ සැලකිය යුතු ප්‍රමාණයකින් හෝ උද්ධෘතයකින් තොරව අන් අයකුගේ ක්ෂේත්‍ර වාර්තා පොතකින්, පර්යේෂණ පත්‍රිකාවකින් නිබන්ධයකින්, වෙනත් පොතකින් හෝ අන්තර්ජාලයෙන් ලබාගත් කරුණු වලින් සකසා ඉදිරිපත් කිරීම මගින් බුද්ධිමය දේපළ වංචාව (රචනා චෞරය) සිදු කිරීම. | • ශිෂ්‍යභාවය අහෝසි කිරීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br><br>(3.9 සහ 3.11) |

| | |
|---|---|
| 2.8 ප්‍රශ්න පත්‍රයක හෝ පිළිතුරු පත්‍රයක ඇතුළත් දේ අයථා ලෙස දැන ගැනීම හෝ ඒ සඳහා තැත් කිරීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>• පන්ති / සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර /තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.2, 3.3, 3.4, 3.5 සහ 3.11) |
| 2.9 අවසරයකින් තොරව විභාග ශාලාවට ඇතුළුවීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම<br>• අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>(3.2, සහ 3.3) |
| 2.10 අවසරයකින් තොරව විභාග ශාලාවෙන් පිටවීම හෝ ඒ සඳහා තැත් කිරීම. | • විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>(3.1) |
| 2.11 කිසිදු කඩදාසියක් හෝ ලියන පොතක් ඉරීම,පොඩි කිරීම හෝ වෙනත් අයුරකින් විනාශ කර දැමීම හෝ ඒ සඳහා තැත් කිරීම. | • අවසානවිභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට/ සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>• පන්ති/සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.<br>• ශිෂ්‍යභාවය වසරකින් අත්හිටුවීම. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.2, 3.3, 3.4, 3.5, 3.6 සහ 3.11) |

| | |
|---|---|
| 2.12 විභාග ශාලාවේ නිශ්ශබ්දතාවයට හා නිසි පරිදි කටයුතු කරගෙන යාමට බාධාවන පරිදි හැසිරීම. | • විභාග අපේක්ෂකයාගේ පිළිතුරු පත්‍රය අවලංගු කිරීම සහ අදාළ ප්‍රශ්න පත්‍රයට නැවත පෙනී සිටීමේ දී ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට<br>• සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>(3.1 සහ 3.3) |
| 2.13 විභාග ශාලාධිපතිගේ හෝ නිරීක්ෂකවරුන්ගේ හෝ / සහ ශාලා සේවකයන්ගේ ආත්ම ගරුත්වයට හානි වන ලෙස සහ මානසික ආතතියක් ඇතිවන පරිදි අනිසි අන්දමින් හැසිරීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම. පන්ති/සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම.<br>• ශිෂ්‍යභාවය වසර දෙකකින් හෝ තුනකින් අත්හිටුවීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්යමණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.2, 3.3, 3.4, 3.5, 3.7 සහ 3.11) |
| 2.14 විභාග ශාලාධිපති, නිරීක්ෂකවරුන්, ශාලා සේවකයන් සහ අනෙකුත් විභාග අපේක්ෂකයන්ට මානසික හෝ ශාරීරික හිංසා කිරීමට සැලසුම් කිරීම, තැත් කිරීම හෝ හිංසාකිරීම. | • ශිෂ්‍යභාවය අහෝසි කිරීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.9 සහ 3.11) |
| 2.15 (i) වෙනත් අපේක්ෂකයකුගේ විභාග අංකයක් භාවිතා කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම. | • අවසාන විභාග ප්‍රතිඵල නිකුත් කිරීම අධ්‍යයන වර්ෂයකින් ප්‍රමාද කිරීම.<br>• උපාධි ප්‍රදානෝත්සවයට /සමර්පණෝත්සවයට නොකැඳවීම.<br>• අදාළ විෂය ඒකකයෙහි ප්‍රතිඵල අවලංගු කිරීම හා ඒ සඳහා නැවත පෙනී සිටීමේ දී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සාමාන්‍ය සාමාර්ථ්‍යයක් සඳහා වන අවම ලකුණු සංඛ්‍යාවට සීමා කිරීම.<br>• පන්ති / සම්මාන සාමර්ථ්‍යයක් ලබා නොදීම ශිෂ්‍යභාවය වසර හතරකින් හෝ පහකින් අත්හිටුවීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.2, 3.3, 3.4, 3.5, 3.8 සහ 3.11) |

| | |
|---|---|
| 2.15 (ii) අපේක්ෂකයකු තමන් වෙනුවෙන් පෙනී සිටීමට වෙනත් කෙනෙකු යෙදවීම. | • ශිෂ්‍යභාවය අහෝසි කිරීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.9 සහ 3.11) |
| 2.16 වෙනත් විභාග අපේක්ෂකයකු වෙනුවෙන් කෙනෙකු පෙනී සිටීම. | **ශිෂ්‍යයෙකු නම්**<br>ශිෂ්‍යභාවය අහෝසි කිරීම.<br>විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.9 සහ 3.11)<br>**ශිෂ්‍යයෙකු නොවේ නම්**<br>ඔහුට/ඇයට එරෙහිව රටේ පවතින නීතියට අනුව ක්‍රියා කිරීම.<br>• විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හෝ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (ස්ථිර/තාවකාලික) බඳවා නොගැනීම.<br>(3.10 සහ 3.11) |
| 2.17 සනාතන සභාව මගින් තීරණය කළ හැකි අනෙකුත් විභාග අක්‍රමිකතා. | සනාතන සභාව මගින් නියම කරනු ලබන දඬුවම්. |
| 2.18 පිළිතුරු පත්‍ර ලකුණු කරන පරීක්ෂකවරයකු විසින් වාර්තා කරනු ලැබ සනාතන සභාව විසින් අනුමත කළ අක්‍රමිකතා. | අක්‍රමිකතාවය අනුව සනාතන සභාව මගින් නියම කරනු ලබන දඬුවම්. |
| 2.19 විභාග අක්‍රමිකතාවයක් කිරීමට ආධාර හෝ අනුබල දීම. | අනුබල හෝ ආධාර දුන් විභාග අක්‍රමිකතාවයට නියමිත සියලු දඬුවම්. |

## 4. විභාග අක්‍රමිකතා නිර්ණය සඳහා යොදා ගත හැකි සාක්ෂි

4.1 විභාග අක්‍රමිකතා වාර්තාව

4.2 අක්‍රමිකතාව සිදු වූ අවස්ථාවේ සොයාගත් ද්‍රව්‍යමය සාක්ෂි සහ ඇසූ දුටු සාක්ෂි (ලිපිලේඛන, ඡයාරූප සහ වීඩියෝ දර්ශන ආදිය)

4.3 සොයා ගත් ආචාර්යවරයාගේ ලිඛිත හෝ වාචික ප්‍රකාශය

4.4 ශිෂ්‍යයාගේ ලිඛිත හෝ වාචික ප්‍රකාශය

4.5 සිද්ධිය වන අවස්ථාවේ සිටි ශිෂ්‍යයන්ගේ/කාර්ය මණ්ඩලයේ වාචික හා ලිඛිත ප්‍රකාශ

4.6 කමිටුවේ සභාපතිගේ අභිමතය පරිදි කැඳවිය හැකි අනෙකුත් සාක්ෂි (උදා : ලබා ගත් ලකුණු/පිළිතුරු පත් ආදිය)

## 5. සනාතන සභා විභාග අක්‍රමිකතා කමිටුව

කිසියම් විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් කෙරෙන සෑම පරීක්ෂණයක්ම සනාතන සභා විභාග අක්‍රමිකතා කමිටුවේ පරීක්ෂණයට භාජනය විය යුතුය.

ඒ ඒ පීඨයේ විභාග අවසන් වූ දින සිට හෝ 2.7 (1), 2.7 (11), 2.17 සහ 2.18 අංක දරණ අක්‍රමිකතා සොයාගත් උත්තර පත්‍ර පරීක්ෂක, නිබන්ධන පරීක්ෂක හෝ පරීක්ෂක ඒ පිළිබඳව උපකුලපතිතුමාට/නියෝජ්‍ය ලේඛකාධිකාරී/විභාග වෙත දැනුම් දුන් දින සිට හෝ සතියක් ඇතුළත සනාතන සභා විභාග අක්‍රමිකතා කමිටුව රැස් විය යුතුය.

## 5.1 සංයුතිය

සනාතන සභාව මඟින් වර්ෂ 03 ක කාල සීමාවක් සඳහා එක් පීඨයකින් මහාචාර්යවරයකු බැගින් සාමාජිකයන් පස් දෙනෙකු පත් කළ යුතුය. මහාචාර්යවරයකු නොමැති අවස්ථාවක දී අවම වශයෙන් ඒ සඳහා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු පත් කළ යුතුය.

සභාපති ලෙස ඉහත සාමාජිකයන් අතුරින් එක් මහාචාර්යවරයෙකු සනාතන සභාව මඟින් පත්කළ යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග නිල බලයෙන් ලේකම් හා කැඳවුම්කරු විය යුතුය.

## 5.2 පරීක්ෂණ ක්‍රමවේදය

විභාග අක්‍රමිකතාව සම්බන්ධයෙන් ශාලාධිපති විසින් එවන ලද වාර්තාව සලකා බැලීම.

අවශ්‍යතාව අනුව විභාග අක්‍රමිකතා නිර්ණය සඳහා ඉහත දක්වා ඇති සාක්ෂි එකක් හෝ වැඩි ගණනක් යොදා ගැනීම.

චූදිත අපේක්ෂකයා සාක්ෂි හා නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සඳහා කැඳවීම අනිවාර්ය වේ. (ඔහු/ඇය) නොපැමිණියහොත් එය පරීක්ෂණය කරගෙන යාමට බාධාවක් නොවේ.)

## 5.3 තීරණ

චූදිත විභාග අපේක්ෂකයා වරදකරුද/නිවැරදිකරු ද යන වග නිර්ණය කිරීම.

වරදකරු නම් සිදුකර ඇති අක්‍රමිකතා හෝ අක්‍රමිකතාව අනුව අදාළ දඬුවම් සනාතන සභාවට නිර්දේශ කිරීම.

## 5.4 කාල රාමුව

ඉහත තීරණ සනාතන සභා විභාග අක්‍රමිකතා කමිටු රැස්වීමෙන් පසුව එළඹෙන ප්‍රථම සනාතන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

# 6. තීරණ ක්‍රියාත්මක කිරීම සහ අභියාචනා ඉදිරිපත් කිරීම.

ඉහත තීරණ ක්‍රියාත්මක කළ යුත්තේ සනාතන සභාවේ අනුමැතිය ලැබීමෙන් පසුවය.

විභාග අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් පනවන ලද ඕනෑම දඬුවමකට එරෙහි ව අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අයිතිය අදාළ ශිෂ්‍යයාට ඇත. එම දඬුවම් පිළිබඳ තීරණය දැනුම් දී සති තුනක් ඇතුළත අදාළ ශිෂ්‍යයා විසින් තම ලිඛිත අභියාචනය උපකුලපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතුය. අනතුරුව සනාතන සභාව විසින් පත් කරනු ලබන සනාතන සභා විභාග අක්‍රමිකතා කමිටුවේ සාමාජිකයන් නොවන, මහාචාර්යවරුන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මඟින් එම අභියාචනය විමර්ශනය කොට, කමිටුවේ නිර්දේශ සනාතන සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.